# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2291/27 - 2022 අගෝස්තු මස 03 වැනි බදාදා - 2022.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය: පීඑස්/සීඑස්ඒ/00/1/14/39.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසිනි**

මුද්‍රාව

රනිල් වික්‍රමසිංහ

1. ජනාධිපති නීතිඥ ගරු බුවනෙක පණ්ඩුකාභය අලුවිහාරේ මැතිතුමා
   ශ්‍රෙෂ්ඨාධිකරණ විනිසුරු
2. සේනාධිපති මුදියන්සේලාගේ වික්‍රමසිංහ මැතිතුමා
   හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
3. නානායක්කාර අපරැක්කගේ සුජීව වසන්ත කුමාර මැතිතුමා
   අතිරේක ප්‍රධාන තක්සේරුකරු

වෙත :

ශුභාශිංසන පූර්වකවයි !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිවරයා විසින්, සංශෝධිත (393 වන අධිකාරය වන) 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, වර්ෂ 2022 ක් වූ මැයි මස 31 වැනි දිනැති අධිකාරි පත්‍රය මගින්, 2022 මාර්තු මස 31 වැනි දින සිට 2022 මැයි මස 15 වැනි දින දක්වා කාල පරිච්ඡේදය තුළ දිවයිනේ ප්‍රදේශ කිහිපයක සිදු වූ ගිනි තැබීම් ඇතුළු සියලු ආකාරයේ විනාශකාරී ක්‍රියාවන්, මංකොල්ලකෑම් සහ සොරකම් හේතුවෙන් සිදු වූ ජීවිත අහිමි වීම් සහ පුද්ගලයින්ට තුවාල සිදු වීම්, දේපල අලාභ හානි සහ විනාශ වීම් පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීම සඳහා වන පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබ ඇති හෙයින් ද,

තව ද, එකී අධිකාරී පත්‍රය මගින් පරීක්ෂණ කොමිෂන් සභාව විසින් අදාළ කරුණු පිළිබඳව තොරතුරු ලබා ගැනීම, විමර්ශනය හා පරීක්ෂා කිරීමේ දී සලකා බැලිය යුතු කාල පරිච්ඡේදය 2022 මාර්තු මස 31 වැනි දින සිට 2022 මැයි මස 15 වැනි දින දක්වා වශයෙන්

1A - G 37166 — 366 (2022/08)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

සඳහන් කර ඇතත්, ඉන්පසුව ද 2022 ජූලි මස 22 වැනි දින දක්වා ද වරින්වර ගිනි තැබීම් ඇතුළු සියලු ආකාරයේ විනාශකාරී ක්‍රියාවන්, මංකොල්ලකෑම් සහ සොරකම් හේතුවෙන් සිදු වූ ජීවිත අහිමි වීම් සහ පුද්ගලයින්ට තුවාල සිදු වීම්, දේපල අලාභ හානි සිදුවී ඇති බව මා වෙත වාර්තා වී ඇති බැවින් ද,

එසේ හෙයින්, පරීක්ෂණ කොමිෂන් සභාව විසින් අදාළ කරුණු පිළිබඳව තොරතුරු ලබා ගැනීම, විමර්ශනය හා පරීක්ෂා කිරීම සඳහා සළකා බැලිය යුතු කාල පරිච්ඡේදය 2022 මාර්තු මස 31 වැනි දින සිට 2022 ජූලි මස 22 වැනි දින දක්වා වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් විධානය කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විසි දෙකක් වූ අගෝස්තු මස 01 වැනි දින, කොළඹ දී දෙන ලදී.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**ඊ. එම්. එස්. බී. ඒකනායක,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.